## ගෙවුම් තුලනය

### සමස්ත උපනතීන්

1993 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලනයෙහි දක්නට ලැබුණු සැලකියයුතු ලක්ෂණයක් වූයේ, විදේශීය සම්පත්හි අඛණ්ඩ වර්ධනයත් සමග සමස්ථ ශේෂයේ ඇති වූ විගැහි දශ ලක්ෂ 375 ක අතිරික්තයයි. ගෙවුම් තුලනයෙහි ඇති වූ මෙම ශක්තිමත් තත්ත්වය ජංගම හා ප්‍රාග්ධන ගිණුම්වල ඇති වූ වර්ධනයන් තුළින් පිළිබිඹු විය. වෙළෙඳ ගිණුමෙහි පිරිහීමක් ඇති වුවද සේවා ගිණුමේ හා පෞද්ගලික සංක්‍රාමවල සිදුවූ සැළකිය යුතු වර්ධනය නිසා 1993 වර්ෂයේදී ජංගම ගිණුමේ හිඟය විගැහි දශලක්ෂ 29 කින් අඩු විය. ප්‍රධාන වශයෙන් පෞද්ගලික ප්‍රාග්ධන ගලාඒම් නිසා ප්‍රාග්ධන ගිණුමේ ශුද්ධ ලැබීම් විගැහි දශලක්ෂ 228 කින් වැඩිවිය. මෙම වර්ධනයන්ට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ජංගම ගිණුමේ ගණුදෙනු පිළිබඳව පනවා තිබූ සීමාවන් තව දුරටත් ලිහිල් කිරීම සහ අඛණ්ඩව ක්‍රියාත්මක වූ රටෙහි ස්ථායිකරණ වැඩ පිළිවෙලත්ය. මෙම ස්ථායිකරණ වැඩ පිළිවෙල මගින් පෞද්ගලික අංශය මුල්වූ වර්ධනයක් සඳහා රටෙහි කැපවීම කෙරෙහි පෞද්ගලික අංශය තැබූ විශ්වාසය වර්ධනය කෙරිණ.

ගාමික වූ අපනයන අංශයෙහි වැඩිවීම 1993 දී සියයට 17 ඉක්මවීය. මේ අතර, ප්‍රාග්ධන හා අන්තර් භාණ්ඩ ආනයන වියදම වැඩිවීමේ හේතුවෙන් ආනයන වියදම සියයට 16 කට ආසන්න ප්‍රමාණයකින් වැඩිවිය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 1992 විගැහි දශලක්ෂ 740 ක්ව පැවති වෙළෙඳ හිඟය 1993 දී විගැහි දශ ලක්ෂ 825 දක්වා පුළුල් විය. මෙයට ප්‍රතිවිරුද්ධව, තාවකාලික දත්තයන්ට අනුව, 1981 න් පසු සේවා ගිණුමේ ප්‍රථම අතිරික්තය වාර්තා විය. 1992 වාර්තා වූ විගැහි දශලක්ෂ 23 (රුපියල් දශලක්ෂ 1,430) ක සේවා ගිණුම් හිඟය හා සසඳන කළ, විගැහි දශලක්ෂ 31 (රුපියල් දශලක්ෂ 2,043) ක මෙම අතිරික්තය සැළකිය යුතු වර්ධනයක් විය. මේ අතර, වර්ෂ දෙක තුලදී තාවකාලික දත්තවලට අනුව, පෞද්ගලික ප්‍රේෂණ ශුද්ධ ලැබීම් විගැහි දශලක්ෂ 328 (රුපියල් දශලක්ෂ 20,253) සිට විගැහි දශලක්ෂ 402 (රුපියල් දශලක්ෂ 27,090) දක්වා වර්ධනය විය. කෙසේ වුවද විගැහි දශලක්ෂ 115 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති නිල සංක්‍රාම පෙර වසරේ විගැහි දශලක්ෂ 130 හා සසඳන කළ නොකඩවා පහත වැටීමක් පෙන්නුම් කළේය. ඒ අනුව 1992 විගැහි දශලක්ෂ 306 (රුපියල් දශලක්ෂ 18,935) වූ ජංගම ගිණුමේ හිඟය 1993 අවසන් වන විට විගැහි දශලක්ෂ 277 (රුපියල් දශලක්ෂ 18,604) දක්වා අඩු විය. වසර දෙක අතර තුලදී ජංගම ගිණුමේ හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස සියයට 4.5 සිට සියයට 3.8 දක්වා පහත වැටුණි.

රජය ලත් සහනදායී ණය මාර්ගයෙන් ප්‍රාග්ධන ගාලාඒම මූල්‍ය වෙළඳපළ ආයෝජන හා සෘජු ආයෝජන යන දෙකෙන්ම ලත් විදේශීය පුද්ගලික ප්‍රාග්ධන ගලාඒම මාර්ගයට විතැන්වීමේ මෑතකාලීන අඛණ්ඩ ප්‍රවනතාවය ප්‍රාග්ධන ගිණුමේ වෙනස්වීම් මගින් පිළිබිඹු වේ. 1992 වසරේදී දක්නට ලැබුණු පරිදිම, රාජ්‍ය අංශය වෙත ලැබෙන ප්‍රාග්ධන ගලාඒම් බලාපොරොත්තු වූවාට වඩා පහත් මට්ටමක පැවතිණි. මෙයට හේතුව වූයේ ප්‍රධාන වශයෙන් යෝජනා ක්‍රම ආධාරවල ඌණ උපයෝජනයක් පැවතීම සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබීමට නියමිතව තිබූ කෘෂිකාර්මික වැඩසටහන් ණය ක්‍රමයේ දෙවන අදියර කල්යාමත් ය. කෙසේ වුවද, රජයට ලැබුණු සහනදායී ආධාරවල ඌණ උපයෝගීතාවය නිසා ඇතිවුණු අඩුව, සෘජු විදේශීය ආයෝජන සමඟ වැඩිවුණු මූල්‍ය වෙළෙඳපොළ ආයෝජන සහ ඒ හා සම්බන්ධ ණය ප්‍රාග්ධන ගාලාඒම් වලින් සමහන් විය. මෙම තත්ත්වයන් ප්‍රාග්ධන ගිණුම සැළකියයුතු ලෙස ශක්තිමත් කිරීමට හේතු විය. මෙහි අවසාන ප්‍රතිඵලය වශයෙන් පෙර වර්ෂයේදී විගැහි දශලක්ෂ 133 ක්වූ සමස්ථ ගෙවුම් තුලන අතිරික්තය 1993 වර්ෂයේදී විගැහි දශලක්ෂ 375 ක් බවට පත්විය. මේ හේතුවෙන් 1992 වර්ෂාවසානයේ විගැහි දශලක්ෂ 1,047 ක් (රුපියල් දශලක්ෂ 66,236) වූ රටේ දළ විදේශීය වත්කම් ප්‍රමාණය 1993 වර්ෂාවසානය වනවිට විගැහි දශලක්ෂ 1,543 (රුපියල් දශලක්ෂ 105,239) දක්වා වැඩිවිය. එය 1994 වර්ෂයේ අපේක්ෂිත ආනයන මාස 5.6 ක් මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් විය. 1992 වර්ෂාවසානයේදී එයට අනුරූප ප්‍රමාණය මාස 4.4 ක් විය.

## ගෙවුම් තුලනය

ත්‍රෛමාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව

ගෙවුම් තුලනයෙහි මෙම දියුණුව ප්‍රධාන වශයෙන්ම වෙළෙඳ හා ගෙවුම් ක්‍රමය ලිහිල් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අවධාරණය කල යුතුය. මාර්තු මාසයේ ඇති කරන ලද මෙම ප්‍රතිපත්ති ලිහිල් කිරීම්වල ප්‍රධාන පියවරක් වූයේ අපනයන ඉපැයීම් ප්‍රේෂණ ගෙන්වා ගැනීමේ හා පවාරන අවශ්‍යතාවය ඉවත් කිරීම සහ සේවා ගෙවීම් සඳහා තිබූ සීමාවන් තවදුරටත් ලිහිල් කිරීමය. වර්ෂයේ ඉතිරි කාලය තුළදී ඉතිරිව තිබූ ජංගම ගිණුමේ ගනුදෙණු වලට බලපාන විනිමය පාලන රෙගුලාසි ඉවත් කරන ලද අතර, මේ නිසා 1993 අවසන් වනවිට වෙළෙඳ ගෙවීම් හෝ විදේශීය සංචාර, අධ්‍යාපනය, වෛද්‍ය ප්‍රතිකාර වැනි සේවා ගෙවීම් සඳහා හෝ බලපෑ විනිමය පාලන නීති කිසිවක් නොවීය. තවද ආනයන බදු පහත හෙලන ලද අතර, ආරක්ෂක, සෞඛ්‍ය හා පරිසර හේතුන් මත බලපත්‍ර ලබා ගතයුතු භාණ්ඩ හැරුණු විට බලපත්‍ර මත ආනයනය කළයුතු භාණ්ඩ සංඛ්‍යාව අඩු කරන ලදී. මේ අතර, ආනයන හා අපනයන සම්බන්ධයෙන් තීරු ගාස්තු හා බදු ක්‍රමය සරල සහ විධිමත් කිරීමේ අරමුණින් සංශෝධනය කරන ලද අතර, විදේශීය ආයෝජන සානුබල ක්‍රමද සරල සහ පැහැදිලි කිරීමේ අරමුණින් විධිමත් කරන ලදි.

මෙම පසුබිම යටතේ, ශ්‍රී ලංකා ආර්ථිකයේ විදේශීය අංශය, වසර තුලදී සිත් ඇදගන්නා සුළු ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කළේය. සාරාංශ වශයෙන් ගත් කල ගාමික අපනයන අංශය, සේවා අංශය අතිරික්තයක් බවට හැරීම, පෞද්ගලික සංක්‍රාමවල අඛණ්ඩ වර්ධනය සහ පෞද්ගලික විදේශීය ආයෝජන ගලාඒමේ වර්ධනය, ගෙවුම් තුලනයෙහි සමස්ත අතිරික්තයක් ඇතිවීමට සහ විදේශ සංචිතවල ආනයන ධාරිතාවය සැළකිය යුතු මට්ටමකින් වැඩි කිරීමටත් සමත් විය. ගෙවුම් තුලනයේ දක්නට ලැබුණු මෙම වර්ධනයන් ඉතා සැළකිය යුතු ඒවා වූ අතර, එය මූල්‍ය අංශයෙහි අස්ථාවර භාවයක් ඇති කිරීමට ප්‍රබල සාධකයක් බවට පත්විය. එමනිසා මුදල් සැපයුමෙහි ඇති වූ ප්‍රසාරණය සමනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට සිදුවිය.

## 1.49 සංඛ්‍යා සටහන

## 1989-1993 ගෙවුම් තුලනය - විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම

| ශීර්ෂය | විගැහි දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1989 | 1990 | 1991 | 1992(අ) | 1993(ආ) | 1989 | 1990 | 1991 | 1992(අ) | 1993(ආ) |
| 1. වෙළෙඳ භාණ්ඩ | -530 | -518 | -726 | -740 | -825 | -24,050 | -28,145 | -41,252 | -45,785 | -55,486 |
| අපනයන | 1,207 | 1,456 | 1,491 | 1,745 | 2,046 | 56,175 | 79,481 | 84,379 | 107,855 | 138,174 |
| ආනයනය | 1,737 | 1,974 | 2,217 | 2,485 | 2,871 | 80,225 | 107,626 | 125,631 | 153,640 | 193,660 |
| 2. සේවා | -123 | -72 | -65 | -23 | 31 | -5,609 | -3,905 | -3,773 | -1,430 | 2,043 |
| ලැබීම් | 314 | 391 | 440 | 489 | 535 | 14,598 | 21,364 | 24,897 | 30,256 | 36,050 |
| ගෙවීම් | 437 | 463 | 505 | 512 | 504 | 20,207 | 25,269 | 28,670 | 31,686 | 34,007 |
| 3. භාණ්ඩ හා සේවා (1+2) | -653 | -590 | -791 | -763 | -794 | -29,659 | -32,050 | -45,025 | -47,215 | -53,443 |
| 4. සංක්‍රාම (ශුද්ධ) | 405 | 398 | 441 | 457 | 517 | 18,591 | 21,660 | 25,030 | 28,280 | 34,839 |
| පෞද්ගලික (ශුද්ධ) | 258 | 268 | 293 | 328 | 402 | 11,840 | 14,518 | 16,623 | 20,253 | 27,090 |
| නිල (ශුද්ධ) | 147 | 130 | 148 | 130 | 115 | 6,751 | 7,142 | 8,407 | 8,027 | 7,749 |
| 5. ජංගම ගිණුම් ශේෂය (3+4) | -248 | -192 | -350 | -306 | -277 | -11,068 | -10,390 | -19,995 | -18,935 | -18,604 |
| 6. මූල්‍ය නොවන ප්‍රාග්ධනය (ශුද්ධ) | 216 | 345 | 475 | 381 | 609 | 10,566 | 18,931 | 27,171 | 23,450 | 40,917 |
| සෘජු ආයෝජන (ශුද්ධ) | 14 | 24 | 46 | 86 | 134 | 633 | 1,294 | 2,633 | 5,315 | 9,107 |
| විවිධ ආයෝජන (ශුද්ධ) | - | 7 | 24 | 18 | 48 | - | 390 | 1,329 | 1,122 | 3,272 |
| පෞද්ගලික දිගුකාලීන (ශුද්ධ) | -39 | -33 | -18 | 18 | 132(ඇ) | -1,803 | -1,835 | -1,005 | 1,162 | 8,849(ඇ) |
| පෞද්ගලික කෙටිකාලීන (ශුද්ධ) | 72 | 48 | 35 | 91 | 105 | 3,557 | 2,685 | 2,105 | 5,652 | 7,110 |
| රාජ්‍ය දිගුකාලීන (ශුද්ධ) | 169 | 299 | 366 | 189 | 190 | 8,179 | 16,397 | 20,849 | 11,494 | 12,579 |
| ලැබීම් | 291 | 392 | 463 | 313 | 334 | 13,811 | 21,497 | 26,378 | 19,193 | 22,316 |
| ගෙවීම් | 122 | 93 | 97 | 124 | 144 | 5,632 | 5,100 | 5,529 | 7,699 | 9,738 |
| රාජ්‍ය කෙටිකාලීන | - | - | 23 | -22 | - | - | - | 1,260 | -1,295 | - |
| 7. රුපියල් අගය පිළිබඳ ගැලපිලි | - | - | - | - | - | -108 | 751 | 235 | 1,555 | -1420 |
| 8. විගැහි වෙන් කිරීම් | - | - | - | - | - | - | - | - | - | - |
| 9. වැරදීම් හා අත්හැරීම් | -34 | -14 | +28 | +59 | +43 | -1,295 | -1,812 | +2,729 | +3,399 | +3,236 |
| 10. සමස්ත ශේෂය | -67 | +138 | +152 | +133 | +375 | -1,905 | +7,480 | +10,140 | +9,469 | +24,130 |
| 11. මූල්‍ය වෙනස්වීම් (-අතිරික්තය) | +67 | -138 | -152 | -133 | -375 | +1,905 | -7,480 | -10,140 | -9,469 | -24,130 |
| විනිමය අනුපාතිකය ශ්‍රී ලංකා රුපියල්/විගැහි | - | - | - | - | - | 46.19 | 54.42 | 56.61 | 61.75 | 67.39 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| වෙළෙඳ ගිණුම | - | - | - | - | - | -9.55 | -8.75 | -11.07 | -10.82 | -11.18 |
| ජංගම ගිණුම | - | - | - | - | - | -4.39 | -3.23 | -5.37 | -4.47 | -3.75 |
| ජංගම ගිණුම-ප්‍රදානයන් ඉවත්කළ පසු | - | - | - | - | - | -7.07 | -5.45 | -7.62 | -6.37 | -5.31 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ). සංශෝධිත (ආ) තාවකාලික

(ඇ). ගුවන් යානා දෙකක් ආනයනය කිරීම සඳහා පසුගිය වර්ෂයේ ගෙවන ලද අත්තිකාරම් ගෙවීම් වල ගැලපුම් ප්‍රාග්ධන ලැබීම්වලට ඇතුලත්වේ.

සටහන: මූල්‍ය අංශයේ සියළු ගණුදෙනු කාලච්ඡේදය අවසානයේ පැවති විනිමය අනුපාතිකය අනුව පරිවර්තනය කොට ඇත.

## ගෙවුම් තුලන විග්‍රහය

### වෙළෙඳ ගිණුම

1993 වර්ෂයේදී විදේශීය වෙළෙඳ අංශය මිශ්‍ර ප්‍රතිඵල පෙන්නුම් කළේය. අපනයනවල වර්ධනය අඛණ්ඩ වූ අතර, අපනයන ඉපැයීම් 1992 වසරේ විගැහි දශලක්ෂ 1,745 (රුපියල් දශලක්ෂ 107,855) සිට 1993 විගැහි දශලක්ෂ 2,046 (රුපියල් දශලක්ෂ 138,174) දක්වා සියයට 17 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. පසුගිය වසරේ සාපේක්ෂ වැඩිවීමද සියයට 17 විය. එම වසරේ පැවැති තියගය නිසා, හානි පැමිණි කෘෂිකාර්මික අපනයන මෙම වසරේදී සියයට 9 කින් වැඩිවීම සහ කාර්මික අපනයන සියයට 20 කින් වැඩිවීම රටේ අපනයන ක්‍රියාකාරිත්වයෙහි සැළකිය යුතු ලක්ෂණයන් විය. මේ අතර, ආනයන වියදම විගැහි දශලක්ෂ 2,871 (රුපියල් දශලක්ෂ 193,660) දක්වා සියයට 16 කට ආසන්න ප්‍රමාණයකින් වැඩිවිය. එයාර් ලංකා සමාගම අභස්යානා ප්‍රතිසම්පාදන වැඩපිළිවෙල යටතේ ඇමරිකන් ඩොලර් දශලක්ෂ 87 ක වටිනාකමකින් යුත් ගුවන් යානා 2 ක් මිළදී ගැනීමත්, රජය දුම්රිය සහ බස් ප්‍රවාහන පහසුකම් දියුණු කිරීමේ අරමුණෙන් ප්‍රාග්ධන භාණ්ඩ ආනයන කිරීමත් මෙම වර්ධනයට බෙහෙවින් දායක විය. මේ අතරම විනිමය පාලන නීතිරීති ඉවත් කිරීම සහ තීරුබදු හා බලපත්‍ර ලිහිල් කිරීම මගින්, ආනයන සඳහා පැවති බාධාවන් ඉවත් කිරීම සහ වර්ධනය වන නිෂ්පාදන අපනයන අංශයෙහි වැඩිවන අවශ්‍යතා සඳහා අන්තර් භාණ්ඩ සහ යන්ත්‍ර හා උපකරණ වැනි ආයෝජන භාණ්ඩ ආනයනය කිරීම ආනයන විශාල ලෙස වැඩිවීමට දාකය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1992 හා 1993 වර්ෂ තුලදී වෙළෙඳ ගිණුමේ හිගය විගැහි දශලක්ෂ 740 (රුපියල් දශලක්ෂ 45,785) සිට විගැහි දශලක්ෂ 825 (රුපියල් දශලක්ෂ 55,486) දක්වා වැඩිවිය. කෙසේ වෙතත් පුළුල් වූ ආර්ථික කටයුතුවලට දායක වූවා වියහැකි පිළිවෙලින් සියයට 15 කින් හා සියයට 24 කින් ඉහළ ගිය අන්තර් භාණ්ඩ හා ආයෝජන භාණ්ඩ ආනයනය හා සසඳන කල, පාරිභෝගික භාණ්ඩ ආනයනයන්හී ඇතිවූයේ සියයට 6 ක සුළු වැඩිවීමක් නිසා වෙළෙඳ ගිණුමේ හිගය වැඩිවීම එතරම් සැළකිය යුතු කරුණක් නොවේ. ඇත්තවශයෙන්ම ගුවන් යානා, බස් රථ සවිකිරීම් කොටස් හා දුම්රිය මැදිරි වැනි විශේෂිත ආනයන අත්හැර බැලුවහොත් වෙළෙඳ ගිණුමේ හිගය විගැහි දශලක්ෂ 705 දක්වා අඩුවන අතර, දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ගත් කල එය 1992 මට්ටම වූ සියයට 10.6 සිට 1993 දී සියයට 9.6 දක්වා අඩු වේ.

### සේවා ගිණුම

1982 සිට සේවා ගිණුමෙහි නොකඩවා පැවැති හිගය අතිරික්තයක් බවට පත්වීම 1993 ගෙවුම් තුලනයේ දක්නට ලැබුණු එක් යහපත් වර්ධනයක් විය. ඒ අනුව 1992 වර්ෂයේදී සේවා ගිණුමේ පැවැති විගැහි දශලක්ෂ 23 (රුපියල් දශලක්ෂ 1,430) ක හිගය වෙනුවට 1993 වර්ෂයේදී විගැහි දශලක්ෂ 31 (රුපියල් දශලක්ෂ 2,043) ක අතිරික්තයක් දක්නට ලැබුණි. සේවා ගිණුමෙහි ඇතිවූ මෙම යහපත් වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක වූයේ *වරාය ඉපැයීම් සහ රටේ විදේශීය සම්පත්වල ඇතිවූ වර්ධනය නිසා වැඩිවූ ආයෝජන ආදායමයි. මේ අතර, සංචාරක පැමිණීම් සංඛ්‍යාවේ ආන්තික අඩුවීමක් ඇති වුවද, සංචාරක අංශයේ ක්‍රියාකාරිත්වය ප්‍රශංසණීය තත්ත්වයක පැවතුණි. එක් සංචාරකයෙකු මෙහි ගත කරන සාමාන්‍ය කාලය හා දිනක සාමාන්‍ය වියදම වර්ධනය වීම නිසා, පැමිණීමේ අඩුවීම තුලින් ඇතිවූ බලපෑම අවම කළ අතර සංචාරක අංශයේ ඉපැයීම් විගැහි දශලක්ෂ 139 සිට විගැහි දශලක්ෂ 146 දක්වා සියයට 5 කින් වර්ධනය විය. මේ අතර, විදේශීය සංචාර සඳහා මෙන්ම වෙනත් සේවා සඳහා කරන ලද ගෙවීම්වල වැඩිවීම, මෙම සේවා සඳහා අදාළ විනිමය නීතිරීති වසර තුළ සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම නිසා ඇතිවූ තත්ත්වයන්හී පිළිබිඹුවක් විය.

---

* 1.50 වැනි සංඛ්‍යා සටහනෙහි (ආ) අධෝලිපිය බලන්න.

## 1.50 සංඛ්‍යා සටහන
## 1989-1993 සේවා සහ සංක්‍රාම

| ශීර්ෂය | විගැහි දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1989 | 1990 | 1991 | 1992(අ) | 1993(ආ) | 1989 | 1990 | 1991 | 1992(අ) | 1993(ආ) |
| වරාය, ප්‍රවාහන හා රක්ෂණය | -8 | 10 | 28 | 32 | 73 | -322 | 522 | 1,588 | 1,965 | 4,944 |
| ලැබීම් | 102 | 125 | 150 | 157 | 171 | 4,710 | 6,815 | 8,497 | 9,696 | 11,509 |
| ගෙවීම් | 109 | 115 | 122 | 125 | 98 | 5,032 | 6,293 | 6,909 | 7,731 | 6,565 |
| සංචාර | 6 | 40 | 45 | 60 | 60 | 278 | 2,190 | 2,545 | 3,711 | 3,984 |
| ලැබීම් | 59 | 94 | 116 | 139 | 146 | 2,759 | 5,143 | 6,571 | 8,573 | 9,815 |
| ගෙවීම් | 54 | 54 | 71 | 79 | 86 | 2,481 | 2,953 | 4,026 | 4,862 | 5,831 |
| ආයෝජන ආදායම් | -124 | -123 | -130 | -127 | -85 | -5,738 | -6,685 | -7,367 | -7,821 | -5,757 |
| ලැබීම් | 46 | 68 | 40 | 48 | 79 | 2,106 | 3,728 | 2,259 | 2,997 | 5,366 |
| ගෙවීම් | 170 | 191 | 170 | 175 | 164 | 7,844 | 10,413 | 9,626 | 10,818 | 11,123 |
| 3.1 ලාභ සහ ලාභාංශ | -13 | -19 | -12 | -22 | -19 | -608 | -1,006 | -718 | -1,391 | -1,316 |
| ලැබීම් | - | - | 2 | 1 | 4 | 18 | 11 | 89 | 84 | 279 |
| ගෙවීම් | 13 | 19 | 14 | 24 | 23 | 626 | 1,017 | 807 | 1,476 | 1,595 |
| 3.2 පොළී | -110 | -104 | -117 | -104 | -66 | -5,130 | -5,679 | -6,649 | -6,430 | 4,441 |
| ලැබීම් | 46 | 68 | 38 | 47 | 75 | 2,088 | 3,717 | 2,170 | 2,913 | 5,087 |
| ගෙවීම් | 156 | 172 | 155 | 151 | 141 | 7,218 | 9,396 | 8,819 | 9,342 | 9,528 |
| රජයේ සේවා | 2 | -3 | -3 | -3 | -11 | 77 | -195 | -170 | -176 | -714 |
| ලැබීම් | 17 | 11 | 17 | 13 | 11 | 785 | 586 | 953 | 825 | 736 |
| ගෙවීම් | 15 | 14 | 20 | 16 | 22 | 708 | 781 | 1,123 | 1,001 | 1,450 |
| වෙනත් සේවා | 1 | 5 | -5 | 15 | -6 | 96 | 263 | -369 | 891 | -415 |
| ලැබීම් | 91 | 93 | 117 | 132 | 127 | 4,237 | 5,092 | 6,616 | 8,165 | 8,623 |
| ගෙවීම් | 90 | 88 | 122 | 117 | 134 | 4,141 | 4,829 | 6,985 | 7,273 | 9,038 |
| මුළු සේවා | -123 | -72 | -65 | -23 | 31 | -5,609 | -3,905 | -3,773 | -1,430 | 2,043 |
| ලැබීම් | 314 | 391 | 440 | 489 | 535 | 14,598 | 21,364 | 24,897 | 30,256 | 36,050 |
| ගෙවීම් | 437 | 463 | 505 | 512 | 504 | 20,207 | 25,269 | 28,670 | 13,686 | 34,007 |
| පෞද්ගලික සංක්‍රාම | 258 | 268 | 293 | 328 | 402 | 11,840 | 14,518 | 16,623 | 20,253 | 27,090 |
| ලැබීම් | 279 | 296 | 323 | 389 | 454 | 12,830 | 16,054 | 18,311 | 24,037 | 30,591 |
| ගෙවීම් | 21 | 28 | 30 | 61 | 52 | 990 | 1,536 | 1,688 | 3,784 | 3,501 |
| නිල සංක්‍රාම | 147 | 130 | 148 | 130 | 115 | 6,751 | 7,142 | 8,407 | 8,027 | 7,749 |
| ලැබීම් | 147 | 130 | 148 | 130 | 115 | 6,751 | 7,142 | 8,407 | 8,027 | 7,749 |
| ගෙවීම් | - | - | - | - | - | - | - | - | - | |
| මුළු සංක්‍රාම | 405 | 398 | 441 | 457 | 517 | 18,591 | 21,660 | 25,030 | 28,280 | 34,839 |
| ලැබීම් | 426 | 426 | 471 | 518 | 569 | 19,581 | 23,195 | 26,718 | 32,064 | 38,340 |
| ගෙවීම් | 21 | 28 | 30 | 61 | 52 | 990 | 1,536 | 1,688 | 3,784 | 3,501 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ංශෝධිත -

වකාලික - 1993 දී දත්ත එකතුකිරමේ ක්‍රමය වෙනස්කිරීම හේතුවෙන්, සේවා ගිණුමේ විශේෂයෙන්ම 1,4 හා 5 1993 වර්ෂය අදාල දත්ත, සෘජුවම පෙර වර්ෂ හා ගැලපිය

ආයෝජන ආදායම් ලැබීම් 1992 හා 1993 වසර දෙක තුළදී විගැහි දශලක්ෂ 48 සිට විගැහි දශලක්ෂ 79 දක්වා සියයට 64 කටත් වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ ගියේය. වසර දෙක තුළදී විගැහි දශලක්ෂ 658 සිට විගැහි දශලක්ෂ 1,145 දක්වා වැඩිවූ ශ්‍රී ලංකා මහ බැංකුවේ දළ සංචිතවල ආයෝජන අදායම, මෙම වැඩිවීමට බොහෝදුරට හේතු විය. මේ අතර, විදේශීය සෘජු ආයෝජන වැඩි වුවද, ලාභ හා ලාභාංශ ප්‍රේෂණය පසුගිය වසරේ පැවති මට්ටමේම පැවතුණි. මෙය විදේශීය ආයෝජකයන් ආයෝජන ඉපියීම් තම රටවලට ප්‍රේෂණය කරනවාට වඩා ශ්‍රී ලංකාවේ නැවත ආයෝජනය කිරීමෙන් ඉහළ ඉපයීම් අනුපාතයක් ලැබීමට ඇති හැකියාව පිළිබඳව මෙන්ම, රටේ ආර්ථිකය නොකඩවා ලිහිල් කිරීම් පිළිබඳව දක්වන ලද ප්‍රතිචාරයක්ද විය හැක. පොළී ගෙවීම් විගැහි දශලක්ෂ 141 දක්වා විගැහි දශලක්ෂ 10 කින් අඩුවීමත් සමඟ පෙර වසරේ පැවති විගැහි දශලක්ෂ 127 ක් වූ ආයෝජන ආදායම් ශුද්ධ ගෙවීම්, මෙම වසරේදී විගැහි දශලක්ෂ 85 දක්වා අඩුවිය. පසුගිය වර්ෂ තුන තුළදී හිඟය ක්‍රමයෙන් අඩුවී අතිරික්තයක් බවට පත්වීමෙන් දක්නට ලැබුණු සේවා ගිණුමේ සමස්ථ ශක්තිමත් භාවය, සේවා ගිණුමට බලාපාන සීමාවන් ඉවත්කිරීම නිසා ගෙවුම් තුලනයේ සේවා ගිණුමෙහි අත්‍යාවශ්‍යයෙන්ම පිරිහීමක් ඇති වියයුතු නැතැයි යන අදහස හා ගැලපේ.

### සංක්‍රාම ගිණුම

සංක්‍රාම ගිණුමේ, විශේෂයෙන්ම පෞද්ගලික ප්‍රේෂණ ශුද්ධ ලැබීම්වල අඛණ්ඩ වර්ධනයක් දක්නට ලැබිණි. වසර දෙක අතර කාලය තුළ පෞද්ගලික ප්‍රේෂණ දළ ලැබීම් විගැහි දශලක්ෂ 389 (රුපියල් දශලක්ෂ 24,037) සිට විගැහි දශලක්ෂ 454 (රුපියල් දශලක්ෂ 30,591) දක්වා සියයට 17 කින් වර්ධනය විය. ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් විශේෂයෙන්ම මැද පෙරදිග රටවලට නොකඩවා විදේශගත වීම, මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වුන අතර, එතෙර සිටින ශ්‍රී ලාංකිකයන් ආකර්ශණීය දේශීය පොළී අනුපාතයන්ට සහ ශ්‍රී ලංකාවේ මූල්‍ය ස්ථාවරත්වය කෙරෙහි වර්ධනයවූ විශ්වාසයට දැක්වූ ප්‍රතිචාරයත් මෙයින් පිළිබිඹු විය. මේ අතර, පෞද්ගලික සංක්‍රාම ගෙවීම් 1993 වසරේදී විගැහි දශලක්ෂ 52 ක් වූ අතර, එය ශ්‍රී ලාංකික අනේවාසිකයන්ගේ වත්කම් ප්‍රේෂණය මත පනවා තිබූ සීමාවන් ලිහිල් කිරීම පිළිබඳව ගත් තීරණ දෙකක ප්‍රතිඵලයක් වශයෙන් 1992 වාර්තා වූ විගැහි දශලක්ෂ 61 ට වඩා අඩු විය. වසර දෙක තුළදී භාණ්ඩ හා ව්‍යාපෘති දීමනා වශයෙන් රජයට ලැබුණු නිල සංක්‍රාම විගැහි දශලක්ෂ 130 සිට විගැහි දශලක්ෂ 115 දක්වා අඩු විය. මෙම අඩුවීම සිදු වුවද 1992 හා 1993 අතර සංක්‍රාම ගිණුමේ ශුද්ධ ලැබීම්වල විගැහි දශලක්ෂ 457 (රුපියල් දශලක්ෂ 28,280) සිට විගැහි දශලක්ෂ 517 (රුපියල් දශලක්ෂ 34,839) ක සමස්ථ වර්ධනයක් දක්නට ලැබුණි.

### ජංගම ගිණුම

වෙළෙඳ ගිණුමේ හිඟය වැඩි වුවද සේවා සහ සංක්‍රාම ගිණුම්වල දක්නට ලැබුණු සැළකිය යුතු වර්ධනය නිසා ජංගම ගිණුමේ හිඟය 1992 විගැහි දශ ලක්ෂ 306 සිට 1993 විගැහි දශ ලක්ෂ 277 දක්වා ආන්තික වශයෙන් අඩුවීමට හේතු විය. මෙම හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ගත් කල, වසර දෙක තුළ සියයට 4.5 සිට සියයට 3.8 දක්වා අඩු විය. ප්‍රදානයන් රහිතව ගත්කල මෙම අනුපාතිකය වසර දෙක තුළදී සියයට 6.4 සිට සියයට 5.3 දක්වා අඩුවිය. දෙවන වසරටත් නොකඩවා සිදු වූ ජංගම ගිණුමේ හිඟය අඩුවීම ඉතා සුළු වුවද, එය විදේශීය අංශයේ සිදුවූ යහපත් වර්ධනයකි.

### ප්‍රාග්ධන ගිණුම

1993 දී ප්‍රාග්ධන ගිණුමේ පෞද්ගලික අංශයට ලැබුණු ශුද්ධ ලැබීම්වල වැඩිවීමක් වාර්තා විය. මූල්‍ය නොවන ප්‍රාග්ධන ලැබීම් විගැහි දශ ලක්ෂ 381 (රුපියල් දශලක්ෂ 23,450) සිට විගැහි දශ ලක්ෂ 609 (රුපියල් දශලක්ෂ 40,917) දක්වා සියයට 60 ක සැළකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. මෙම වැඩිවීම සම්පූර්ණයෙන්ම විවිධ අංශයන්හී පෞද්ගලික විදේශීය ප්‍රාග්ධන ලැබීම්වල වර්ධනය නිසා සිදුවිය.

1993 වසරේදී ආයෝජන මණ්ඩලය යටතේ ඇති ව්‍යවසායයන්ගේ සැළකිය යුතු පුළුල් වීමක් දක්නට ලැබුණි. 1992 හා 1993 දෙවසර අතර වාණිජ කටයුතුවල යෙදුන නව

# විදේශ වත්කම්

ත්‍රෛමාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව

ව්‍යවසායයන්ගේ සංඛ්‍යාව 58 සිට 94 දක්වා වර්ධනය වූ අතර, 1993 අවසාන වන විට මෙබඳු, මුළු ව්‍යවසායයන් සංඛ්‍යාව 305 ක් විය. මෙම වර්ධනයත් සමඟම ආයෝජන මණ්ඩලය යටතේ පවතින ව්‍යවසායයන්ට ලැබුණු සෘජු විදේශීය ආයෝජන මෙන්ම, වසර තුළ පෞද්ගලිකරණය කරන ලද රාජ්‍ය ආයතනවලට ලැබුණු ආයෝජන වල මුළු ප්‍රමාණය 1993 වසරේදී විගැහි දශ ලක්ෂ 134 ක් විය. මෙය පෙර වසරේ ලැබුණු මුළු ප්‍රමාණය වූ විගැහි දශලක්ෂ 86 හා සසඳන කළ සියයට 56 ක වැඩිවීමක් විය. මේ අතරම, කොළඹ කොටස් හුවමාරු වෙළෙඳපොළෙහි කටයුතුවල වේගවත් වර්ධනයක් පසුගිය වසර පුරාම දක්නට ලැබුණ අතර, මූල්‍ය වෙළෙඳපොළ ආයෝජන කටයුතු සඳහා වූ ලැබීම් පෙර වසරේ විගැහි දශ ලක්ෂ 18 ක සිට මේ වසරේ විගැහි දශලක්ෂ 48 දක්වා වර්ධනය විය. මෙලෙසම, පෞද්ගලික දිගුකාලීන ප්‍රාග්ධන ලැබීම්වලද ප්‍රමාණවත් වර්ධනයක් දක්නට ලැබුණි. එයාර් ලංකා ආයතනයෙහි අහස්යානා ප්‍රතිසම්පාදන වැඩපිළිවෙල හා ප්‍රධාන දේශීය මූල්‍ය ආයතනයන් 3 ක් මගින් රාජ්‍ය අනුග්‍රහය ලද බස්රථ සවිකිරීමේ ව්‍යාපෘතිය සඳහා විශාල විදේශීය ප්‍රාග්ධන ප්‍රමාණයක් ලැබුණි. එසේම සංවර්ධන මූල්‍ය ආයතන මගින් ණයට දීම සඳහාද ආයෝජන මණ්ඩලය යටතේ ඇති ව්‍යවසායයන්ගේ සෘජු ආයෝජන ඉහළ නැංවීම සඳහාද ණය ප්‍රාග්ධන ලැබිණ. මේ අතර ගෙවීම්වල එයාර් ලංකා ආයතනය ගුවන්යානා මිලදී ගැනීම සඳහා කරන ලද ගෙවීම් හා කලින් ගත්තා ලද ණය සඳහා ආයෝජන මන්ඩලය යටතේ වූ ව්‍යවසායයන්ට කරන ලද ගෙවීම් ඇතුලත් විය. මෙම පෞද්ගලික දිගුකාලීන ප්‍රාග්ධන ලැබීම්වල අවසන් ප්‍රතිඵලය වශයෙන් පසුගිය වසරේ විගැහි දශලක්ෂ 18 වූ ශුද්ධ ලැබීම් 1993 දී විගැහි දශලක්ෂ 132 විය.

1992 විගැහි දශ ලක්ෂ 91 ක් වූ පෞද්ගලික කෙටිකාලීන ප්‍රාග්ධන ශුද්ධ ලැබීම් 1993 දී විගැහි දශලක්ෂ 105 දක්වා වැඩිවිය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව එහි කෙටිකාලීන ණය ප්‍රමාණය සැළකිය යුතු ලෙස අඩුකරගත් අතර, විදේශීය ව්‍යවහාර මුදල් ඒකක මගින් ආයෝජන මණ්ඩලයට අයත් නොවන අපනයනකරුවන් සඳහා ප්‍රදානය කෙරුණු විදේශීය ණය පහසුකම් දේශීය බැංකු ඒකක වෙත වර්ෂය මුලදී මාරුකිරීම නිසා මෙම ගණයට අයත් අපනයනකරුවන් විසින් කෙටිකාලීන ණය ශුද්ධ ආපසු ගෙවීමක් කරන ලදී. මේ අතරම ආයෝජන මණ්ඩලය යටතේ නිෂ්පාදනයන්හි වූ වර්ධනය සමග අමුද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා ඔවුන්ට දෙන ලද කෙටිකාලීන ණය පහසුකම් සැළකිය යුතු ලෙස වැඩිවිය. ඒ අනුව, ආයෝජන මණ්ඩලයට අයත් නොවන ආයතන විසින් සිදු කරන ලද ශුද්ධ ගෙවීම් තිබුණද පෞද්ගලික කෙටිකාලීන ප්‍රාග්ධන ප්‍රවාහයන්හි විගැහි දශලක්ෂ 105 ක ශුද්ධ ලැබීමක් වාර්තා විය.

පෞද්ගලික ප්‍රාග්ධන ලැබීම්වලට ප්‍රතිපාර්ශිකව රජයට ලැබුණු ශුද්ධ ලැබීම් පෙර වසරේ පැවැති මට්ටමේම, එනම් විගැහි දශ ලක්ෂ 190 ක මට්ටමේම පැවැතිණි. මුළු ණය ලැබීම්වලට විගැහි දශ ලක්ෂ 21 ක වර්ධනයක් එක් කරමින් සහනදායී ණය ලැබීම්වල වර්ධනයක් දක්නට ලැබුණි. කෙසේ වෙතත් පෙර වසරට වඩා ණය ආපසු ගෙවීම්වල වර්ධනයක් දක්නට ලැබුණු අතර, එහි ප්‍රතිඵලය වූයේ ශුද්ධ ලැබීම් සම මට්ටමේම පැවැතීමයි. තවදුරටත් රජයට ලැබුණු සහනදායී ආධාර ප්‍රධාන වශයෙන් ආසියානු සංවර්ධන බැංකුව (විගැහි දශලක්ෂ 88), ජාත්‍යන්තර සංවර්ධන සංගමය (විගැහි දශලකෂ 87) හා ජපානය (විගැහි දශලක්ෂ 66) යන මූලයන්ගෙන් ලැබුණි.

## 1.51 සංඛ්‍යා සටහන
## 1989-1993 ශ්‍රී ලංකාවේ විදේශීය වත්කම්

| කාලපරිච්ඡේදය අවසානයේ අයිතිය | විගැහි දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1989 | 1990 | 1991 | 1992 | 1993 | 1989 | 1990 | 1991 | 1992 | 1993 |
| 1. රජය (අ) | 32.3 | 19.3 | 26.7 | 23.4 | 23.4 | 1,696.1 | 1,104.5 | 1,631.6 | 1,482.1 | 1,597.2 |
| 2. රාජ්‍ය නියෝජිකත්ව | - | - | - | - | - | 1.0 | 1.1 | 1.1 | 1.0 | 1.1 |
| 3. මහ බැංකුව | 191.3 | 286.3 | 475.9 | 657.9 | 1,144.9 | 9,962.5 | 16,399.2 | 28,956.9 | 41,591.7 | 78,073.6 |
| 4. වෙළෙඳ බැංකු | 223.2 | 296.4 | 306.2 | 365.7 | 374.9 | 11,729.9 | 16,966.8 | 18,633.4 | 23,160.7 | 25,567.2 |
| 5. එකතුව | 446.8 | 602.0 | 808.8 | 1,047.0 | 1,543.2 | 23,389.5 | 34,471.6 | 49,223.0 | 66,235.5 | 105,239.1 |
| 6. දළ විදේශීය සම්පත් මගින් කළ හැකි ආනයන-මාස ගණන | | | | | | | | | | |
| 6.1 වෙළෙඳ භාණ්ඩ | 3.1 | 3.7 | 4.4 | 5.1 | 6.5 | | | | | |
| 6.2 භාණ්ඩ හා සේවා | 5.2 | 3.0 | 3.6 | 4.2 | 5.5 | | | | | |

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග එකගවන ලද නියෝජන අනුපාතිකයට අනුව පරිවර්තනය කරන ලද මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ සමහර ශීර්ෂයන් හැර ඉතිරිය පහත සඳහන් කාලපරිච්ඡේද අවසානයේ වූ විනිමය අනුපාතිකයන්ට අනුව පරිවර්තනය කර ඇත.

| වර්ෂය | 1989 | 1990 | 1991 | 1992 | 1993 |
|---|---|---|---|---|---|
| විගැහි 1 කට රුපියල් | 52.57 | 57.25 | 60.85 | 63.33 | 68.19 |

(ආ) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් නමින් ඇති ගිණුමේ හර ශේෂයන් ඇතුළත් කිරීම සඳහා 1985 සිට සංඛ්‍යා සංශෝධනය කර ඇත.

## විදේශීය වත්කම්

වර්ෂය තුළ නොකඩවා ගලා ආ විදේශීය ප්‍රාග්ධනය ලැබීම් 1993 වර්ෂයේ විදේශීය අංශයේ කැපී පෙනෙන ලක්ෂණයක් විය. මෙම වාතාවරණය තුළ 1992 වර්ෂාවසානයේදී විගැහි දශ ලක්ෂ 1,047 ක්ව පැවති ශ්‍රී ලංකාවේ දළ විදේශීය වත්කම් 1993 වර්ෂාවසානය වන විට විගැහි දශ ලක්ෂ 1,543 දක්වා සියයට 47 ක වැඩිවීමක් වාර්තා කළේය. මෙය 1993 වර්ෂයේ ගෙවුම් තුලන වර්ධනයට අදාළ කලින් සඳහන් කල අයිතමයන්ගේ වැඩිවීමත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) ට සම්බන්ධ ගණුදෙනු නිසා සංචිත වශයෙන් විගැහි දශලක්ෂ 38 ක ශුද්ධ ලැබීමක් පිලිබිඹු කරයි. විදේශීය වත්කම්වල දක්නට ලැබුණ සමස්ථ වර්ධනය ප්‍රධාන වශයෙන් පිළිබිඹු කළේ විගැහි දශ ලක්ෂ 1,145 දක්වා සියයට 74 කින් වර්ධනය වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශීය වත්කම්වල වර්ධනයයි. වාණිජ බැංකුවල විදේශීය වත්කම් විගැහි දශ ලක්ෂ 375 දක්වා සියයට 3 කින් ප්‍රසාරණය වූ අතර, 1992 වර්ෂාවසානයේ සිට 1993 වර්ෂාවසානය දක්වා රජයේ වත්කම් විගැහි දශලක්ෂ 23 ක නොවෙනස් මට්ටමක පැවතුණි. මේ අතර වර්ෂ දෙක තුලදී ශ්‍රී ලංකා මහ බැංකුව හා රජයේ විදේශීය වත්කම් වලින් සමන්විත වූ දළ නිල සංචිත විගැහි දශලක්ෂ 681 සිට විගැහි දශලක්ෂ 1,168 දක්වා ඉහළ ගියේය. 1993 වර්ෂය අවසානයේ පැවැති දළ විදේශීය වත්කම් 1994 වර්ෂයේ අපේක්ෂිත ආනයන මාස 5.6 ක් මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් වූ අතර, පැවැති දළ නිල සංචිත ප්‍රමාණය ආනයන මාස 4.2 ක් මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් විය.

## විනිමය අනුපාතික සංචලනයන්

1993 වර්ෂයේදී සියළුම ප්‍රධාන විදේශීය මුදල් වර්ගවලට එරෙහිව ශ්‍රී ලංකා රුපියලෙහි අගය වෙනස්වීම මිශ්‍ර වූ ස්වභාවයකින් පැවතිණ. මෙය ප්‍රදාන වශයෙන් ජාත්‍යන්තර විදේශීය විනිමය හා මූල්‍ය වෙළෙඳපොළවල පැවති අවිනිශ්චිතතාවයන් හේතුවෙන් ප්‍රධාන මුදල් වර්ගවල හරස් විනිමය අනුපාතයන්හී ඇති වූ උච්චාවචනයන්හී පිළිබිඹුවක් විය. මෙම වාතාවරණය තුළ ශ්‍රී ලංකා රුපියල, මැදිහත්වීම සඳහා යොදා ගැනෙන මුදල වූ අමෙරිකන් ඩොලරයට ප්‍රතිමුඛව නොකඩවා පිරිහුණු අතර, ජපන් යෙන්, ස්ටර්ලින් පවුම්, ඩොයිෂ් මාර්ක් හා ප්‍රංශ ප්‍රැන්ක්වලට ප්‍රතිමුඛව එ.ජ. ඩොලරයේ ඇති වූ උච්චාවචනයන්ට අනුරූපව රුපියලේ අගය වසර තුළ වෙනස්වීම් පෙන්නුම් කළේය. මෙම විචලනයන්ගේ සමස්ථ බලපෑම වූයේ 1992 වර්ෂාවසානයේ සිට 1993 වර්ෂාවසානය දක්වා ශ්‍රී ලංකා රුපියල, ජපන් යෙන් (සියයට 16.6), එ.ජ. ඩොලරය (සියයට 7.2), ස්ටර්ලින් පවුම (සියයට 5.5), ප්‍රංශ ප්‍රැන්ක් (සියයට 0.9) සහ ඩොයිෂ් මාර්ක් (සියයට 0.6) වලට ප්‍රතිමුඛව පිරිහීමයි. වර්ෂ දෙක තුලදී විගැහි වලට ප්‍රතිමුඛව ශ්‍රී ලංකා රුපියල සියයට 7.1 කින් පිරිහුණු අතර, ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 11.1 කින් අගය වැඩි වීමක් පෙන්නුම් කළේය. මෙම කාලසීමාව තුළදී ඉන්දියාවේ ආර්ථික ප්‍රතිපත්තිවල සිදුවූ සැළකිය යුතු වෙනස්වීම් සමඟ 1993 මාර්තු මාසයේදී ඉන්දියානු බලධාරීන් විසින් ඔවුන්ගේ මුදලෙහි සිදු කරන ලද විශාල අවප්‍රමාණය ද මෙම තත්ත්වයට හේතු විය.

මෙම විනිමය අනුපාතික සංචලනයන්ගේ ඒකාබද්ධ ප්‍රතිපලය පෙන්නුම් කරමින්, ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන් සමඟ වූ නාමික විනිමය අනුපාතික යොදා වෙළඳ බර තැබීම මත පිළියෙල වූ ශ්‍රී ලංකාවේ නාමික සඵල විනිමය අනුපාතිකය ලක්ෂිත පදනම අනුව බලන විට, 1992 දෙසැම්බර් සිට 1993 දෙසැම්බර් දක්වා සියයට 7.2 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. එහෙත් ශ්‍රී ලංකාව හා එහි ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන් අතර උද්ධමන වෙනස්කම් සඳහා ගලපා ගත් පසු ලැබෙන මූර්ත සඵල විනිමය අනුපාතිකය ලක්ෂිත පදනම අනුව බලන විට වසර තුළ රුපියලේ අගයේ සියයට 0.3 ක මූර්ත වැඩිවීමක් පිලිබිඹු විය. මේ අතර 1993 වර්ෂයේදී රුපියලෙහි වාර්ෂික සාමාන්‍ය නාමික හා මූර්ත අගය පිරිහීම පිළිවෙලින් සියයට 5.4 ක් හා සියයට 1.4 ක් විය.

# සඵල විනිමය අනුපාතික*

ත්‍රෛමාසික සාමාන්‍ය

1985 = 100




ශ්‍රී ලංකා මහ බැංකුව

*දර්ශකයේ පහත වැටීම අගය අඩුවීම පෙන්නුම් කරයි.

## 1.52 සංඛ්‍යා සටහන
## 1989-1993 විනිමය අනුපාතික වෙනස්වීම්

| මුදල් වර්ගය | විගැහි දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1989 | 1990 | 1991 | 1992 | 1993 | 1989 | 1990 | 1991 | 1992 | 1993 |
| ඩොයිෂ් මාර්ක් | 23.7002 | 26.1554 | 28.0178 | 28.5714 | 28.7371 | -22.03 | -9.39 | -6.65 | -1.94 | -0.58 |
| ප්‍රංශ ප්‍රැන්ක් | 6.9354 | 7.7125 | 8.1924 | 8.3857 | 8.4655 | -21.96 | -10.08 | -5.86 | -2.31 | -0.94 |
| ඉන්දියානු රුපියල් | 2.3603 | 2.2332 | 1.6352 | 1.7520 | 1.5774 | -7.44 | 5.69 | 36.57 | -6.67 | 11.07 |
| ජපන් යෙන් | 0.2816 | 0.2943 | 0.3390 | 0.3699 | 0.4433 | -6.58 | -4.32 | -13.19 | -8.35 | -16.56 |
| ස්ටර්ලින් පවුම් | 65.0400 | 75.5908 | 79.5820 | 69.4278 | 73.4972 | -9.17 | -13.96 | -5.02 | 14.63 | -5.54 |
| ඇ.එ.ජ. ඩොලර් | 40.0000 | 40.2400 | 42.5800 | 46.0000 | 49.5615 | -17.42 | -0.60 | -5.50 | -7.43 | -7.19 |
| විශේෂ ගැනුම් හිමිකම් | 52.9300 | 57.2479 | 60.8464 | 63.3337 | 68.1932 | -16.34 | -7.54 | -5.91 | -3.93 | -7.13 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) වෙනස්වීම් ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාල විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම් පදනම් කරගෙනය.

සටහන: සෘණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය අඩුවීම පෙන්නුම් කරයි.

විදේශීය ණය

ශ්‍රී ලංකාවේ ගෙවීමට ඉතිරිව ඇති මුළු විදේශීය ණය ප්‍රමාණය 1993 වර්ෂාවසානය වන විට විගැහි දශලක්ෂ 5,548 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. එය 1992 වර්ෂාවසානයේ සිට 1993 වර්ෂාවසානය වන විට විගැහි දශලක්ෂ 503 ක වැඩිවීමක් පෙන්නුම් කරන්නකි. නොපියවන ලද ණය ප්‍රමාණයෙහි මෙම වර්ධනය වීම රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයටම සමසේ බෙදී යයි. පෞද්ගලික අංශයට ලැබුණ ණය මුදල්වල වර්ධනය පිළිබඳව දැනටමත් ප්‍රාග්ධන ගිණුම යටතේ සාකච්ඡා කර ඇත. ඉහතින් සඳහන් කල පරිදි රජයට ලැබුණු මැදි හා දිගුකාලීන ණය ප්‍රමාණයන්හී වර්ධනයට හේතු වූයේ ආසියානු සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර සංවර්ධන සංගමය හා ජපානයෙන් ලැබුණු සහනදායී ආධාරවල වර්ධනයයි. තීව්‍ර කරන ලද ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම් යටතේ ජා. මූ. අ. මගින් දෙවන වසරේ වැඩසටහනෙහි දෙවන අදියර යටතේ විගැහි දශලක්ෂ 56 ක් මුදා හැර ඇත. ජා. මූ. අ. මගින් හානිපූරක මූල්‍යකරණ පහසුකම් යටතේ අපනයන ආදායම් අඩුවීමක් වෙනුවෙන්, කලින් ලබාගත් ණයක් සඳහා ගෙවීමට ඉතිරිව තිබූ අවසන් ණය ප්‍රමාණය වූ, විගැහි දශලක්ෂ 14ක් සහ ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම් යටතේ 1988 දී ලබා ගන්නා ලද ණය මුදල වෙනුවෙන් වූ විගැහි දශ ලක්ෂ 4 ක් වූ මූලික ආපසු ගෙවීමක් සමඟ ජා. මූ. අ. ට ගෙවීමට ඉතිරිව ඇති ණය ප්‍රමාණය විගැහි දශලක්ෂ 376 දක්වා විගැහි දශලක්ෂ 38 කින් වැඩි විය. .නොපියවූ කෙටිකාලීන ණය විගැහි දශලක්ෂ 526 දක්වා වැඩිවූ අතර මෙයට මුළුමනින්ම හේතුවූයේ ආයෝජන මණ්ඩලය යටතේ වූ ව්‍යවසායයන්හී කෙටිකාලීන ණයවල ඇති වූ වර්ධනයයි.

ණය සේවා ගෙවීම්

මැදි හා දිගුකාලීන ණය ආපසු ගෙවීම් හා සියළුම විදේශීය ණය මත පොලී ගෙවීම් අඩංගු ශ්‍රී ලංකාවේ ණය සේවා ගෙවීම් 1992 හා 1993 අතර කාලයේ විගැහි දශලක්ෂ 354 දක්වා විගැහි දශ ලක්ෂ 28 කින් පහත වැටුණි. මෙම අඩුවීම ණය ආපසු ගෙවීම්වල මෙන්ම, විදේශීය ණය මත පොලී ගෙවීම් වලින් ද පිළිබිඹු විය. එසේ වුවත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අයත් නොවන ණය ආපසු ගෙවීම් විගැහි දශලක්ෂ 18 කින් වර්ධනය විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත කරන ලද ණය ආපසු ගෙවීම් 1992 විගැහි දශ ලක්ෂ 54 සිට 1993 විගැහි දශලක්ෂ 18 දක්වා අඩු විය. මේ අතරම මාර්තු මාසයේ සිට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගෙවීමට ඉතිරිව තිබූ ණය ප්‍රමාණය ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම් හා තීව්‍ර කරන ලද ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම් යටතේ වූ සහනදායී ප්‍රදානයන් විය. ඒ අනුව, ජා. මූ. අ. වෙත පොලී ගෙවීම් ද සැළකිය යුතු ලෙස පහත වැටුණි. වසර දෙක තුලදී පොලී හා ණය ආපසු ගෙවීම්වල සිදුවූ පහත වැටීම භාණ්ඩ හා සේවා අපනයනයන්ගෙන් ලැබූ ආදායමේ වර්ධනය හා එක්ව ණය සේවා අනුපාතිකය සියයට 17.1 සිට සියයට 13.7 දක්වා පහත හෙළීමට සමත් විය. ණය සේවා අනුපාතිකය භාණ්ඩ හා සේවා අපනයන ආදායම්වල සහ පෞද්ගලික සංක්‍රාමවල අනුපාතයක් ලෙස මෙම වසර දෙක තුලදී සියයට 3 කට ආසන්න ප්‍රමාණයකින් එනම් සියයට 14.6 සිට සියයට 11.7 දක්වා පහත වැටුණි.

1.53 සංඛ්‍යා සටහන

## 1989-1993 නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය

| වර්ෂය | විගැහි දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1989 | 1990 | 1991 | 1992(අ) | 1993(ආ) | 1989 | 1990 | 1991 | 1992(අ) | 1993(ආ) |
| 1. මැදි හා දිගු කාලීන ණය | 3,636.3 | 3,822.4 | 4,246.0 | 4,624.3 | 5,022.2 | 190,471.7 | 216,846.3 | 255,798.0 | 289,678.6 | 342,516.9 |
| 1.1 රජයේ (අ) | 2,970.3 | 3,184.4 | 3,589.0 | 3,840.8 | 4,080.7 | 157,188.7 | 182,300.3 | 218,400.0 | 243,250.6 | 278,275.0 |
| 1.2 රජයේ ඇපය සහිත රාජ්‍ය සංස්ථා | 154.0 | 136.0 | 141.0 | 175.6 | 250.8 | 8,136.0 | 7,781.0 | 8,578.0 | 11,120.7 | 17,105.1 |
| 1.3 රජයේ ඇපය සහිත පෞද්ගලික අංශයේ | 108.0 | 108.0 | 120.0 | 129.0 | 144.0 | 6,035.0 | 6,185.0 | 7,319.0 | 8,172.8 | 9,821.6 |
| 1.4 රජයේ ඇපය රහිත රාජ්‍ය සංස්ථා | 6.0 | 5.0 | 3.0 | 2.4 | 1.4 | 341.0 | 290.0 | 197.0 | 151.0 | 96.4 |
| 1.5 රජයේ ඇප රහිත පෞද්ගලික අංශයේ | 123.0 | 101.0 | 113.0 | 138.7 | 169.6 | 6,516.0 | 5,802.0 | 6,867.0 | 8,784.4 | 11,565.5 |
| 1.6 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් කළ ගැණුම් | 275.0 | 288.0 | 280.0 | 337.8 | 375.7 | 12,255.0 | 14,488.0 | 14,437.0 | 18,199.1 | 25,653.3 |
| 2. කෙටි කාලීන ණය | 296.8 | 294.0 | 350.0 | 420.6 | 525.7 | 13,210.0 | 16,820.0 | 20,200.0 | 24,578.6 | 31,689.0 |
| 2.1 රජය | - | - | 21.0 | - | - | - | - | 1,275 | - | - |
| 2.2 මහ බැංකුවේ ණය ගැනීම් | 50.4 | - | - | - | - | 2,632.0 | - | - | - | - |
| 2.3 අනෙකුත් (ඇ) (අ) | 246.4 | 294.0 | 329.0 | 420.6 | 525.7 | 10,578.0 | 16,820.0 | 18,925.0 | 24,578.6 | 31,689.0 |
| 3. මුළු ණය (1+2) | 3,933.1 | 4,116.4 | 4,596.0 | 5,044.9 | 5,547.9 | 203,681.7 | 233,666.3 | 275,998.0 | 314,257.2 | 374,205.9 |
| විශේෂිත අයිතමයන් | | | | | | | | | | |
| මැදි හා දිගුකාලීන ණය | | | | | | | | | | |
| 1. යෝජනා ක්‍රම ණය | 2,050.0 | 2,179.0 | 2,393.0 | 2,555.9 | 2,697.5 | 108,521.0 | 124,775.0 | 145.631.0 | 161,873.4 | 183,954.5 |
| 2. යෝජනා ක්‍රම නොවන ණය | 926.0 | 1,010.0 | 1,177.0 | 1,251.1 | 1,294.9 | 48,998.0 | 57,832.0 | 71,600.0 | 79,233.7 | 88,303.2 |
| 3. සැපයුම් කරුවන්ගේ ණය | 20.0 | 33.0 | 30.0 | 61.2 | 127.8 | 1,046.0 | 1,892.0 | 1,805.0 | 3,873.4 | 8,717.1 |
| 4. ජා.මූ.අ. භාරකාරත්ව අරමුදලේ ණය | 3.3 | 0.4 | - | - | - | 147.7 | 19.3 | - | - | - |
| 5. ජා.මූ.අ. අනෙකුත් ණය | 275.0 | 288.0 | 280.0 | 337.8 | 375.7 | 12,255.0 | 14,488.0 | 14,437.0 | 18,199.1 | 25,653.3 |
| 6. අනෙකුත් (ඇ) | 362.0 | 312.0 | 366.0 | 418.3 | 526.3 | 19,504.0 | 17,840.0 | 22,325.0 | 26,499.0 | 35,888.8 |

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව,
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව.

(අ) සංශෝධිත,
(ආ) තාවකාලික,
(ඇ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රතිග්‍රහණ ණය, වෙළෙඳ ණය සහ විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්ගෙන් ලබාගත් කෙටිකාලීන ණය ඇතුළත්ව.
(ඇ) රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශය මගින් ගත් ණය ඇතුළුව දිගුකාලීන ණය.

## 1.54 සංඛ්‍යා සටහන
## 1989-1993 ණය සේවා ගෙවීම්

| ශීර්ෂය | විගැහි දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1989 | 1990 | 1991 | 1992(අ) | 1993(ආ) | 1989 | 1990 | 1991 | 1992(අ) | 1993(ආ) |
| 1. ණය සේවා ගෙවීම් | 375.0 | 328.6 | 356.3 | 382.3 | 354.0 | 17,138.0 | 17,972.0 | 20,173.0 | 23,671.0 | 23,945.0 |
| 1.1 ණය ආපසු ගෙවීම් | 217.6 | 182.0 | 200.5 | 231.0 | 212.6 | 9,920.0 | 9,975.0 | 11,353.0 | 14,328.8 | 14,417.7 |
| (i) ජා.මු. අරමුදලට | 46.3 | 31.8 | 63.6 | 54.4 | 18.1 | 2,018.0 | 1,731.0 | 3,600.0 | 3,359.4 | 1,219.7 |
| (ii) අනෙකුත් | 171.3 | 150.2 | 136.9 | 176.6 | 194.5 | 7,902.0 | 8,244.0 | 7,753.0 | 10,969.4 | 13,198.0 |
| 1.2 පොළී ගෙවීම් | 157.4 | 146.6 | 155.8 | 151.3 | 141.4 | 7,218.0 | 7,997.0 | 8,820.0 | 9,342.2 | 9,528.1 |
| (i) ජා.මු. අරමුදලට | 22.7 | 20.6 | 14.7 | 7.8 | 2.1 | 997.0 | 1,121.0 | 830.0 | 480.5 | 141.3 |
| (ii) අනෙකුත් | 134.7 | 126.0 | 141.1 | 143.5 | 139.3 | 6,221.0 | 6,876.0 | 7,990.0 | 8,861.7 | 9,386.8 |
| 2. වෙළෙඳ භාණ්ඩ අපනයන හා සේවාවන්ගෙන් ඉපැයීම් | 1,521.5 | 1,847.0 | 1,930.7 | 2,235.7 | 2,581.4 | 70,772.8 | 100,845.5 | 109,275.0 | 138,111.0 | 174,223.8 |
| 3. වෙළෙඳ භාණ්ඩ අපනයන, සේවා හා පෞද්ගලික සංක්‍රාම ලැබීම් | 1,800.5 | 2,143.0 | 2,253.7 | 2,622.6 | 3,035.0 | 83,602.8 | 116,899.5 | 127,586.0 | 162,147.7 | 204,815.3 |
| 4. ණය සේවා අනුපාතික (ඇ) | | | | | | | | | | |
| 4.1 2 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය | 24.6 | 17.8 | 18.5 | 17.1 | 13.7 | 24.2 | 17.8 | 18.5 | 17.1 | 13.7 |
| (ii) ජා.මු. අරමුදලේ ගණුදෙනු හැර | 20.1 | 15.0 | 14.4 | 14.3 | 12.9 | 20.0 | 15.0 | 14.4 | 14.4 | 13.0 |
| 4.2 3 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය | 20.8 | 15.3 | 15.8 | 14.6 | 11.7 | 20.5 | 15.4 | 15.8 | 14.6 | 11.7 |
| (ii) ජා.මු. අරමුදලේ ගණුදෙනු හැර | 17.0 | 12.9 | 12.3 | 12.2 | 11.0 | 16.9 | 12.9 | 12.3 | 12.2 | 11.0 |
| 5. 1 හි ඇතුළත් රජයේ ණය සේවා ගෙවීම් කොටස (ඈ) | 196.3 | 168.0 | 178.0 | 206.0 | 221.6 | 9,066.0 | 9,141.0 | 10,075.0 | 12,713.0 | 14,934.0 |
| 5.1 එය 1 හි ප්‍රතිශතයක් වශයෙන් | 52.4 | 51.1 | 49.9 | 51.1 | 62.6 | 52.9 | 50.9 | 49.9 | 51.0 | 62.4 |

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව,
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව.

(අ) සංශෝධිත,
(ආ) තාවකාලික,
(ඇ) වර්ෂය තුළ විනිමය අනුපාතිකයන්හි සිදු වූ වෙනස්වීම් හේතුවෙන්, රුපියල් වටිනාකම හා විගැහි වටිනාකම අනුව වෙන් වෙන් වශයෙන් ගණනය කරන ලද ණය සේවා අනුපාතිකයන් වෙනස් වේ.
(ඈ) ජා.මු. අරමුදලෙහි ගණුදෙනු හැර.